**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන් දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තරපාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි සහ ගණන් දීමේ නිලධාරි දැනුවත් කරන ලදී .

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් සිදු කළ නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක කර තිබුණු බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

**විගණන නිරීක්ෂණය**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම. | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම් 3 ක අවස්ථා 280 කදී තැන්පත් කර වර්ෂ දෙකකට වඩා කල් ඉකුත්වූ එහෙත් නිරවුල් නොකරන ලද වටිනාකම රු.15,285,438 ක් වූ ශේෂ සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු ශේෂ නිරවුල් කළ යුතු වීම. | මේ පිළිබඳව නිරන්තර කටයුතු කරන ලෙස ලිඛිතව හා මූල්‍ය උපදෙස් මඟින් දැනුවත් කිරීම් කර ඇත. තවද විගණන කළමනාකරණ කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

--------------

**2.1** **අග්‍රිම කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයේ අග්‍රිම සැලසුමට අනුව ඉල්ලුම් කළයුතු අග්‍රිමය රු.14,721,985,000 ක් වු අතර ඉල්ලුම් කරන ලද අග්‍රිමය රු.13,840,349,559 ක් විය. එසේ වුවද එම ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.6,776,120,000 ක් හෙවත් සියයට 49ක් පමණක් ලැබී තිබුණි.මේ හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය සැලසුම් කළ පරිදි ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | අග්‍රිම මුදල් උපරිමය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | • අග්‍රිම සැලසුම් කිරීම හා ඉල්ලුම් කිරීම අදාල අවශ්‍යතාවය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබෙන තෙක් ඉල්ලුම් කිරීම හෝ එයින් කොටසක් ලැබීමෙන් පසු නැවත ඉල්ලුම් කිරීම සිදුවේ. මෙහිදී උදාහරණ ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වර්ෂය තුල අවස්ථා කිහිපයකදී ලබාදී තිබූ අක්මුදල වූ රු. මිලියන 835 ලබාගැනීම සඳහා මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා රු.මිලියන 1,856ක අක්මුදල් ඉල්ලුම් කරන ලදී.<br><br>• ඉල්ලුම් කරන ලද මුළු අක්මුදල් අවශ්‍යතාවය වූ රු. මිලියන 13,840/- න් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල වෙනුවෙන් ඉල්ලුම් කරන ලද අක්මුදල් අගය වූ රු.1,856 හා ගම්පෙරළිය ව්‍යාපෘතිවල අගය වූ රු.3,985 න් ලද අගය ඉවත් කළ පසු අග්‍රිම ඉල්ලුම් කිරීම් රු.මිලියන 7,999 ක් වේ. එයින් ලද අග්‍රිමය රු.මිලියන 6,776 කි. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ සියයට 84 කි. |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූලික ප්‍රතිපාදනය රු.31,100,000 ක් වූ පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා රු.2,100,000 ක් වූ අතිරේක ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණු නමුත් එසේ මාරු කරන ලද ප්‍රතිපාදනය වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන අනුව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව ගැලපුම් දීමනාව මූලික වැටුපට එකතු වීම මත හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ වීම මත වැටුප් වියදම් වැඩිවීම, අතිකාල වියදම් ඉහල යාම, ලිපි ද්‍රව්‍ය අවශ්‍යතාවය වැඩිවීම හා ලිපිද්‍රව්‍ය මිල ගණන් ඉහල යාම, තැපැල් හා දුරකථන අවශ්‍යතා වැඩිවීම, විදුලි පරිභෝජනය වැඩිවීම හා විදුලි ගාස්තු ඉහල යාම, දේපල ණය ඉල්ලුම් කිරීම නිසා ප්‍රතිපාදන මාරු කිරීම සිදු විය. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 03කට අදාලව රු.24,221,808ක් අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 56 ක් දක්වා වූ පරාසයකින් වෙනත් වැය විෂයයන්ට ප්‍රතිපාදන මාරු කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන අනුව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව ගැලපුම් දීමනාව මූලික වැටුපට එකතු වීම, වෙනත් වියදම් යටතේ දැරිය යුතු සමහර වියදම් පරිපාලන වියදම් තුලින් දැරීම, පළාත් පාලන වරිපනම් බදු නිසිකලට ගෙවීම හේතුවෙන් වට්ටම් ලැබීම නිසා ප්‍රතිපාදන මාරු කිරීමට සිදු විය. |

## 2.3 බලය නොලත් කාරක පාඩු

------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------- | නිර්දේශය<br>--------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|---|
| (අ) | මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේදී රු.1,082,245 ක් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාරව පවත්වන ලද පරික්ෂණ මණ්ඩල අවසන් වාර්තාව අනුව මූල්‍ය පාලනය සම්බන්ධව සමස්ථ අධීක්ෂණය පැවරී ඇති නිලධාරින් හතර දෙනාගෙන් අයකර ගත යුතු බවට යෝජනා ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද 2020 මැයි මාසය වන විටත් එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.. | රජයට වූ පාඩුව අය කර ගැනීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය කඩිනමින් ලබාගත යුතු වීම. | එකඟ වේ. මේ පිළිබඳව අලාභ අයකර ගැනීම සදහා අනුමැතිය ලබාදෙන ලෙස 2018.09.19, 2018.10.23, 2018.11.07 හා 2019.01.22 දිනැති සිහිකැඳවීම් ලිපි මගින් ස්වදේශ කටයුතු ලේකම් වෙත දන්වා ඇත. |
| (ආ) | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 251-3437 දරන කැබ් රථය 1999 වර්ෂයේ ජූලි මස අනතුර සම්බන්ධයෙන් රක්ෂණයෙන් අයකර ගත නොහැකි අලාභය රු.189,360 ක් සඳහා සිදු කරන ලද ප්‍රාරම්භක වාර්තාවේ නිර්දේශ අනුව අනතුර සිදු කළ වෑන් රථයේ රියදුරු මේ සඳහා වගකිව යුතු විය. ඒ අනුව අදාළ රියදුරුට එරෙහිව නෛතික කටයුතු ආරම්භ කර ඇතත් වර්ෂය අවසාන වන විටත් එම අලාභය අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | රජයට වූ අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම වාහනයේ අනතුර සම්බන්ධයෙන් මීගමුව දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. විදේශගතව සිටි දෙවන විත්තිකරු වන රියදුරු ලංකාවට පැමිණ ඇති බවට තොරතුරු සොයා ගෙන ඇති අතර, එම තොරතුරු රජයේ නීතීඥවරයා වෙත 2019.05.10 දිනැතිව දන්වා ඇත. තවද මෙහි වර්තමාන තත්ත්වය පිළිබද විමසා රජයේ නීතීඥ වෙත 2020.03.11 දිනැතිව මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ලිපියක් යොමු කර ඇත. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව මන්දගාමීව කටයුතු සිදු කිරීම නිසා මෙම කාර්ය කඩිනමින් අවසන් කිරීමට නොහැකි වී ඇති බව අවධාරණය කරමි. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 44 කින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර තිබූ රු.8,192,596,320 ක් වූ ප්‍රතිපාදනවලින් ව්‍යාපෘති ඉටු නොකිරීම නිසා ඉතිරි වූ ප්‍රතිපාදනය රු.2,990,023,207 ක් හෙවත් වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 36.5 ක් විය. ඒ අතරින් අමාත්‍යාංශ 06 ක් මඟින් විවිධ ව්‍යාපෘති ඉටුකරවා ගැනීම සඳහා ප්‍රතිපාදනය කර තිබූ රු.5,357,851,351ක් සඳහා අවශ්‍ය පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් රු.2,843,950,296 ක් හෙවත් වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 53 ක් වටිනා ව්‍යාපෘති ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | අනුමත ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | • මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට බලපා ඇති ප්‍රධාන සාධකය වන්නේ වර්ෂ අවසානයේදී ගම්පෙරළිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නතර කිරීම හා වර්ෂ අවසානයේදී බිල්පත් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය අක්මුදල් ලබා නොදීම වේ.<br>• මෙම අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක කිරීම අත්හිටවූ ව්‍යාපෘති හැර සියළුම ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කර ඇත. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගොස් ඇති හා පළාත්සභා ආයතන සඳහා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.2,694,690 ක් විය.එම ශේෂය තුල වර්ෂ 4 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින ණය ශේෂයන්ගේ එකතුව රු.1,012,282 ක් විය. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ණය ශේෂ පිළිබඳව නිරන්තර අවධානය යොමු කරන අතර වර්තමාන තත්ත්වය පිළිබඳ 2020 ජුනි 30 දිනට ප්‍රථම අදාල තොරතුරු ලබාගෙන ඉදිරිපත් කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වැඩසටහන් 8ක් යටතේ ව්‍යාපෘති 6404 ක් අනුමත කර තිබුණද එයින් රු.1,426,707,694 ක් වටිනාකම වූ ව්‍යාපෘති 4975 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගත යුතු වීම. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අනුමත වී ඇති රු.73,419,698 ක් වටිනාකම වූ ව්‍යාපෘති 50 ක් සඳහා මිල කැඳවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/GPS/155/09/01/HA/-2019 හා 2019.11.20 දිනැති ලිපියෙන් තාවකාලිකව වැඩ නතර කරන ලදී. |
| (ඇ) | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ වටිනාකම රු.999,048 ක් වූ ව්‍යාපෘති 2 ක් හා වටිනාකම රු.13,243,301 ක් වූ ව්‍යාපෘති 23 ක් සඳහා මිල ගණන් කැඳවා තිබුණද ඉදිරි කටයුතු සිදු නොවීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත ප්‍රතිපාදන උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීමට හැකි ආකාරයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | -එම- |
| (ඈ) | ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂය සඳහා අනුමත ව්‍යාපෘති 360 ක් අතුරින් 77 ක් එනම් සමස්ත ව්‍යාපෘති අතුරින් සියයට 21 ක් පමණ ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත ප්‍රතිපාදන උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීමට හැකි ආකාරයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | එවකට රටේ පැවති දේශපාලන අස්ථාවරත්වය, මූල්‍ය හිඟකම හා කොන්ත්‍රාත්කරුවකු ඉදිරිපත් නොවීම යන හේතු මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගම්පෙරළිය වැඩසටහන යටතේ ඉටු කිරීමට අනුමත කර තිබුණු ව්‍යාපෘති 176 ක් අතුරින් ව්‍යාපෘති 17 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබූ අතර ව්‍යාපෘති 07 ක ප්‍රගතිය සියයට 26ක සිට සියයට 40ක පරාසයක් ගෙන තිබුණි. | -එම- | එවකට රටේ පැවති වතාවරණය අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම නිසා ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කළ නොහැකි විය. ව්‍යාපෘති 7ක මූලික වැඩ ආරම්භ කර තිබුණද අදාළ කොන්ත්‍රාත් සමිති විසින් බිල්පත් ඉදිරිපත් නොකිරීම නිසා ගෙවීම් කටයුතු නොකරන ලදී. |
| (ඊ) | සුබිත පුරවර වැඩ සටහන යටතේ ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුමත වී තිබූ ව්‍යාපෘති 70 න් සම්පූර්ණයෙන්ම වැඩ නිමකර තිබූ ව්‍යාපෘති සංඛ්‍යාව 24 ක් පමණක් විය. | -එම- | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නංවමු ලංකා ජාතික ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ රු.7,018,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | -එම- | මෙහි මූලික කාර්යයන් ඉටුකරන ලද අතර එවකට රටේ පැවති දේශපාලන අස්ථාවරය මත හා මූල්‍ය හිඟතාවය මත ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි විය. |
| (ඌ) | දිවුලපිටිය ප්‍රාදේශීය සභාවෙන් ක්‍රියාත්මක කිරීමට අනුමත කර තිබූ රු.72,807,508 ක් වටිනා ව්‍යාපෘති 155 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සියයට 20 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.14,561,502 ක් 2019 අප්‍රේල් සහ මැයි මාසවලදී දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘති අතුරින් රු.7,325,678 ක අත්තිකාරම් ගෙවා තිබූ ව්‍යාපෘති 82ක ඉදිකිරීම් 2019 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි. | වැඩ ආරම්භ නොකිරීම සම්බන්ධයෙන් කරුණු විමසීම හා අදාල මුදල් වෙනත් කාර්යයන් සඳහා යොදවා ඇත්නම් ඒ පිළිබඳව විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | 2019 නොවැම්බර් 30 දින වන විටත් වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 2020.02.12 දින දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් අධික වර්ෂාව, ව්‍යාපෘති අධික සංඛ්‍යාවක් ඉටුකිරීම, සභාවේ මානව සම්පත්වල හිඟතාවය සභාවෙන් ලැබූ සහයෝග අඩුවීම වැනි කරුණු නිසා ඉටුකිරීම අපහසු වූ බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (එ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේරු.2,701,053 ක් වටිනාකම වූ ව්‍යාපෘති 06 ක් ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණද ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණ අතර එම මුදල් වෙනත් ව්‍යාපෘති සඳහා යොදවා ගැනීමට තිබූ අවස්ථා මගහැරී තිබුණි. | ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජනය ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ගිවිසුම්ගත සංවිධානය විසින් ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා අවලංගු විය. |
| (ඒ) | ගම්පෙරළිය කඩිනම් සංවර්ධන වැඩ සටහන යටතේ ග්‍රාමීය හා නාගරික මට්ටමින් නිවාස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ තාවකාලික වහල ස්ථිර වහල බවට පරිවර්තනය කිරීම වැඩසටහන සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ප්‍රතිලාභීන් 1059 දෙනෙකු සඳහා රු.134,884,000 ක් අනුමත කර තිබුණද ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අනුමත ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත |
| | (ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රතිලාභීන් 190 දෙනෙකු සමග රු.22,635,000 ක වටිනාකමකට ගිවිසුම්ගතව තිබුණද එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත |
| | (iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක ප්‍රතිලාභීන් 1,062 දෙනෙකු සඳහා රු.130,903,965 ක් අනුමත කර තිබුණු අතර නුසුදුසු ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ලබා දී ඇති ආධාර මුදල් අව භාවිතා කිරීම, සැලසුම් පරිදි කාර්ය ඉටු නොකිරීම වැනි විවිධ ගැටළු හේතුවෙන් රු.72,254,965 ක ඉදිරි ගෙවීම් නවතා ඇති අවස්ථා පැවතුණි. | ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී සැබෑ අවශ්‍යතාවය පවතින පුද්ගලයා වෙත ප්‍රතිලාභ ලබාදීමේ නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත |

| | | |
|---|---|---|
| (iv) තාවකාලික වහල ස්ථිර වහල බවට පරිවර්තනය කිරීම සඳහා අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට රු.145,190,000 ක ප්‍රතිපාදනයෙන් ලබාදී තිබුණු අතර ප්‍රතිලාභීන් 898 දෙනෙකු හට රු.86,539,762 ක් පමණක් ගෙවා තිබුණි. | අනුමත ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත |
| (v) මහජන නියෝජිතයන්ගේ අභිමතය පරිදි ප්‍රතිලාභී නිවාස ඒකකයක් වෙනුවෙන් රු.100,000 සිට රු.300,000 අතර විවිධ වටිනාකම් යටතේ නිවාස ආධාර ලබාදී තිබුණි. මෙම වටිනාකම් තීරණය කිරීම සඳහා කුමන නිර්නායකයක් පදනම් කර ගත්තේද යන්න නිරීක්ෂණය නොවුණි. | ප්‍රතිලාභ ලබා දීම සඳහා නිශ්චිත සහ පොදු නිර්නායකයන් සකස් කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත |
| (vi)වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කාර්යය සඳහා මහජන නියෝජිතයන්ගේ මැදිහත් වීම හේතුවෙන් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස ආධාරයක් ලබාදීම අත්‍යාවශ්‍යව පැවති අබලන් වූ නිවාස 06ක් සඳහා නිවාස ආධාර ලබාදී නොතිබුණි. | වගකිව යුතු පාර්ශව විසින් සුදුසු ප්‍රතිලාභීන් පමණක් නිර්දේශ කළ යුතු වීම. | මෙම අධාරලාභීන් හඳුනාගෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සහ අදාල දේශපාලන අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබුවද ප්‍රතිපාදන වෙන්කර ගැනීම සඳහා දේශපාලන අධිකාරිය විසින් යොමු නොකිරීම මත එවැනි ප්‍රතිලාභීන් හට ප්‍රතිලාභ ලබා දීමට නොහැකි විය. |

## 3.2 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ ස්වයං රැකියාලාභීන් සඳහා මධ්‍යම රජයේ ප්‍රතිපාදන යටතේ භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලිය යටතේ 2015 සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාලව ස්වයං රැකියා පුහුණු වීම් ලබාදීමට හා ස්වයං රැකියා උපකරණ ලබාදීම සඳහා පිළිවෙලින් රු.14,795,301 හා රු.235,607,295 ක් වැයකර තිබුණි. ඊට අදාලව සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු ගණනාවක් 2020 සැප්තැම්බර් 04 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව මගින් දිස්ත්‍රික් ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදී . | මුදල් රෙගුලාසි 03 හි සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකිරීමත් ව්‍යාපෘති මනාලෙස සැලසුම් කර ක්‍රියාත්මක කිරීමත් අදාල චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමු කිරීමත්, සම්පත් පැතිකඩ දකින පද්ධතිය යාවත්කාලීන කිරීමත් භාණ්ඩ බෙදාහැරීමේ හා පසු විපරම් ක්‍රමවේදයේ පවතින ගැටළු හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කල යුතු වීම. | මෙහි සඳහන් කරුණු කෙරෙහි මා එකඟ වන අතර මෙම කටයුතු වඩා ඵලදායීව පවත්වාගෙන යාමට නිරන්තරයෙන් මේ පිළිබඳ උපදෙස් ලබාදීමත් ඒ තුලින් ස්වයං රැකියා ලාභීන්ගේ ජන ජීවිතය වඩාත් ඵලදායී දිශාවකට යොමුකිරීමටත් දුගීභාවය අඩුකිරීම මෙන්ම ආදායම් සවිමත් කිරීම සඳහා යම් සහනයක් ලබාදීමට බලාපොරොත්තු වෙමි. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2019 යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආගමික ස්ථාන 23 ක රු.9,430,000 ක වියදමින් සූර්ය පැනල සවි කර තිබුණි. එම සූර්ය පැනල්වලින් 2020 ජනවාරි වන විට විදුලි සැපයුම, ජාතික විදුලි බල | හැකි ඉක්මනින් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කළ යුතු වීම. | මෙම ප්‍රමාදය සඳහා විදුලි බිලෙහි සඳහන් තම විහාරස්ථානවල දැනට වැඩවසන විහාරාධිපතිහිමිගේ නම නොවන බැවින් විදුලි බිලෙහි නම වෙනස් කිරීමට යම්කාලයක් ගතවීම හා ආලෝකය පැවති දිනවලදී මෙම පරීක්ෂණ සිදුකිරීමට විදුලි බල මණ්ඩලයට සිදුවීම හා විදුලිබල |

| | | | |
|---|---|---|---|
| | පද්ධතියට සම්බන්ධ කිරීමට කටයුතු කර තිබුණේ එක් ආගමික ස්ථානයක පමණි. | | සැපයුම සූර්ය බල පද්ධතියට සම්බන්ධ කිරීමේදී විභවතාවය වැඩිවීම පාලනය කලයුතු වීම වැනි තාක්ෂණික කරුණු හේතු විය. |
| (ආ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල අවිධිමත් සහ හානිකර ස්වභාවයෙන් භාවිතාකර තිබූ ඉඩම් හෙක්ටයාර් 285 ක් අතරින් හෙක්ටයාර් 140 ක් පමණ වාරිමාර්ග ගැටළු හේතුවෙන් වගා නොකරන බවත් ප්‍රාග්ධන ගැටළු, අඩු අස්වැන්න සහ අඩු භෝග සනත්වය යන හේතුන් මත ඉඩම් ඌන පරිහරණය සිදුවන බවත් හඳුනාගෙන තිබුණි. | හඳුනා ගන්නා ලද ගැටළුවලට පිළියම් යොදමින් ඉඩම් ඵලදායී ලෙස පරිහරණය කළ යුතු වීම. | 2009 වසරේ ආරම්භ වූ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මගින් දිවයින පුරා ක්‍රියාත්මක කල වැඩසටහනකි. එහිදී අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් පරිහරණ ගැටළු හඳුනාගෙන ඒ සඳහා වගකිවයුතු බලධාරීත්වය දැරූ ආයතන සමඟ එම ගැටළු සාකච්ඡා කර නිර්දේශ ලබාගෙන කොට්ඨාශයට සැලැස්මක් සකස් කිරීම සිදුකල අතර එම සැලැස්ම 2015.06.11 දින ගම්පහ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයේදී අදාල ආයතන කැඳවා ඉදිරි කටයුතු සඳහා සැලසුම් වාර්තාව ප්‍රධානය කිරීම සිදුකර ඇති බව දන්වමි. |
| (ඇ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාඔය ආශ්‍රිත ඉඩම්වල විශාල ප්‍රමාණයේ පස් ඉවත් කිරීම් සිදුකර තිබූ බවත් මතුපිට පස් ඉවත් කිරීම නිසා එම ප්‍රදේශ නිසරු වීම සහ ජලය ඒකරාශීවන විශාල වලවල් සකස් වී තිබීමද අවිධිමත් ඉඩම් පරිහරණයේ ප්‍රධාන ගැටළු වශයෙන් හඳුනාගෙන තිබුණි. | අනවසර පස් ඉවත් කරන්නන් සඳහා නෛතික ක්‍රියාමාර්ග ගත යුතු වීම. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු උපදෙස් හා චක්‍රලේඛ යනාදියට අනුකූල නොවීම සහ සාවද්‍ය ගණනය කිරීම් හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කිරීම නිසා 2019 වර්ෂය අවසානය වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක රු.39,076,832 ක් අයවිය යුතු ශේෂයක් ලෙස පැවතුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | වැඩිපුර ගෙවීම් අයකරමින් පවතී. |
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක පුද්ගලයින් 21 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් ලිපිගොනු නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කරන බව නිරීක්ෂණය විය. | ලිපිගොනු කඩිනමින් සැකසීමට අදාළ කටයුතු කළ යුතු වීම. | විශ්‍රාමිකයා පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛණ ලබාගැනීම සඳහා විශ්‍රාමිකයින් දැනුවත් කිරීම් කළද ප්‍රමාණවත් තොරතුරු ලබාදී නොමැති බැවින් තාවකාලිකව ගොනුවක් සකස් කිරීමට නොහැකි වී ඇත. |
| (ඊ) | 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක විශ්‍රාම වැටුප් සංශෝධනය නොකළ ලිපිගොනු 778 ක් පැවතුණි. | කඩිනමින් සංශෝධන කටයුතු සිදු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත. |
| (උ) | ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයෙකු වෙත 2015 අප්‍රේල් සිට ජූලි දක්වා කාලයට අදාලව ද්විත්ව විශ්‍රාම වැටුප් හා හිඟ වැටුපක් ගෙවීම හේතුවෙන් රු.358,057 ක් වැඩිපුර ගෙවා තිබූ අතර මෙම විශ්‍රාමිකයා 2015 දෙසැම්බර් මාසයේදී මිය ගොස් ඇති බැවින් එම වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ද්විත්ව ගෙවීම් සඳහා වගකිවයුතු පාර්ශව හඳුනාගෙන එම අයගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට ඇතුලත් කිරීමේදී Code එක අංක දෙකකින් දත්ත පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීම නිසා මෙම ද්විත්ව ගෙවීම සිදුවී ඇත. |
| (ඌ) | විශ්‍රාමිකයෙකු, වැන්දඹුවක හෝ වෙනත් අයුරින් විශ්‍රාම ප්‍රතිලාභයක් ලබන අයකු මියගිය වහාම ගෙවීම් නතර කිරීම සඳහා එම තොරතුරු | ප්‍රමාදයට වගකීව යුතු පාර්ශවයන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතු වීම සහ එම පාර්ශවවලින් | කඩිනමින් වාර්තා කරන ලෙස ග්‍රාම නිලධාරින් දැනුවත් කිරීම් සිදුකර ඇති අතර එසේ සිදු නොකරන නිලධාරීන්ට |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත කඩිනමින් වාර්තා කළ යුතු වුවත් 2018 සහ 2019 වර්ෂවලදී ජාඇල සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි එපරිදි කටයුතු කර නොමැති අවස්ථා 23 ක් නිරීක්ෂණය විය. | අයකර ගත යුතු වීම. | ඉදිරියේදී විනය ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (එ) | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වල්පිටමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ඉදිකර ඇති සේවා පියස් ගොඩනැගිල්ල 2015 වර්ෂයේදී රු.300,000 ක් වැයකර අළුත්වැඩියා කර ඇති නමුත් 2019 වර්ෂය අවසානය වන විට මෙම ගොඩනැගිල්ල භාවිතයට ගැනීම අත්හැර දමා තිබුණි. | යටිතල පහසුකම් සම්පූර්ණ කර ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම සේවා පියස ප්‍රාදේශීය සභාව සතු ඉඩමක ඉදිකර ඇති බැවින් විදුලි බලය ලබාගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ එකගතාවය විමසා ලිපියක් යවා ඇතත් මෙතෙක් ඒ පිළිබඳව එකගතාවය ලැබී නොමැත. අනුමැතිය ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. |
| (ඒ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී නිල සෙවන කාර්යාල 11 ක්ද 2018 වර්ෂයේදී කාර්යාල 8 ක්ද ඉදිකර තිබුණි. මෙම කාර්යාල ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී වැනි මහජන සම්බන්ධතා පවතින නිලධාරීන්ගේ භාවිතය සඳහා යොදා ගනිමින් පැවතුණි. එසේ වුවත් කාර්යාල සඳහා ජල හා විදුලි පහසුකම් නොමැති බව නිරීක්ෂණය විය. | ජල විදුලි පහසුකම් සඳහා ප්‍රතිපාදන ලබා ගෙන එම පහසුකම් ලබා දීමට අවශ්‍යකටයුතු කළ යුතු වීම. | ලද උපරිම ප්‍රතිපාදන මුදල තුළ ජලය, විදුලිය සැපයීම සඳහා මුදල් ප්‍රමාණවත් නොවීය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කළ නිල සෙවන කාර්යාල 7 ක අත්තිවාරම පමණක් දමා තිබූ අතර එහි කම්බි දිරාපත් වෙමින් පැවති බව හා ප්‍රදේශය වල් බිහිවී ඇති බව නිරීක්ෂණය විය. | ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබේදැයි තහවුරු කර ගත යුතු වීම සහ එසේ නොමැතිව පවතින තත්ත්වය තුල අඩක් ඉදිකළ ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ප්‍රතිපාදන ඉල්ලා සිටියද ලැබී නොතිබුණි. |
| (ඕ) | මිනුවන්ගොඩ, දිවුලපිටිය හා දොම්පෙ, යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල 2012 වර්ෂයට පෙර සිට වසා දමා ඇති පාසල් සංඛ්‍යාව 11 ක් වූ අතර ඒවා ඵලදායී කටයුත්තක් සඳහා යොදවාගෙන නොතිබුණි. | වසා දැමූ පාසල් ප්‍රාදේශීය ලේකම් වෙත පවරාගෙන ඵලදායී කටයුතුවලට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඵලදායී කටයුතු සඳහා යොදාගැනීමට කටයුතු කරමි. |

## 4. තිරසර සංවර්ධනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර අරමුණු ලගාකරගැනීමට ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන ව්‍යාපෘති වර්ග 19ක් වෙනුවෙන් රු.5,227,396,892ක් උපයෝජනය කර තිබූ අතර එක් එක් තිරසර අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක හා ජයග්‍රහණ දර්ශක සලකා බැලීමේදී ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක 16 ක් අතුරින් වර්තමානය වන විට සියයට 49ක් දක්වා ප්‍රගතියක් ලබා තිබූ ඉලක්ක 04ක්ද සියයට 50ක සිට සියයට 74ක් අතර පරාසයක ප්‍රගතියක් ලබා තිබූ ඉලක්ක 09ක් හා සියයට 75ට වැඩි ප්‍රගතියක් ලබා තිබූ ඉලක්ක 03 ක්ද නිරීක්ෂණය විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව තිරසර සංවර්ධනය උදෙසා තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව අනුමත සේවක සංඛ්‍යාව 3,266 කින් තනතුරු 434 ක පුරප්පාඩුවක් හා තනතුරු 12 ක අතිරික්තයක් පැවතුණි. මෙම පුරප්පාඩු තනතුරු තුල පවතින ග්‍රාම නිලධාරී තනතුරු 144 ක් සඳහා වසර 2කටත් අධික කාලයක සිට වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබූ අතර ඒ සඳහා ස්ථිර නිලධාරීන් පත් කර ගැනීමට මෙතෙක් නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් මහජනතාවට සපයන සේවාවන්හි කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට එය අහිතකර ලෙස බලපෑම් කිරීමේ හැකියාවක පවතී. | අදාළ අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |